# කොවිඩ් 19 සති පාසල -සබරගමු පළාත
## පුරවැසි අධ්‍යාපනය

ඒකකය - 9.1 ජන සමාජයේ සුරක්ෂිත පැවැත්ම සඳහා ක්‍රියාකාරී වූ කටයුතු කිරීම.

සතිය - 1 2021 (පළමු වාර ආරම්භය)

ක්‍රියාකාරකම් - 9.1.1 සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන ආයතන පිළිබඳව විමර්ශනය කරයි.

හැඳින්වීම - 9 ශ්‍රේණියට පිවිසි ඔබට ප්‍රථමයෙන්ම ඉගන ගැනීමට ලැබෙන්නේ සමාජයේදී ඔබට ලැබෙන රැකවරණය පිළිබඳයි. පුරවැසි අධ්‍යාපනය හැදෑරීම තුළින් අපේක්ෂා කරන්නේ ද මෙයයි. පුද්ගලයෙක් සුරක්ෂිත ජීවිතයක් ගොඩනගා ගන්නේ කෙසේද යන්න පිළිබඳවයි. එයට අවශ්‍ය පසුබිම මෙම පාඩම තුලින් ඔබට ලබාගත හැකිය. බියෙන් හා සැකයෙන් තොරව පුද්ගලයාට සමාජයේ සාමාජිකයකු ලෙස ජීවත් වීමට ලැබෙන රැකවරණය සමාජ සුරක්ෂිතතාව ලෙස හැඳින්විය හැකිය**.**

ජන සමාජයක සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීමට පුද්ගලයා ජීවත්වන සමාජය හා එයට සම්බන්ධ සමාජ ආයතන දායක වේ. ජන සමාජය තුළ සමාජ සුරක්ෂිතතාවය රැකීම සඳහා රජය මඟින් විවිධ ආයතන පිහිටුවා ඇති අතර ඒ සඳහා විශේෂ යාන්ත්‍රණ ද ක්‍රියාත්මක කරයි . බහු සංස්කෘතික සමාජයක සමාජ ඒකාබද්ධතාව ඇති කිරීමට ද මේ තුළින් බලාපොරොත්තු වෙයි. ජන සමාජයක සමාජ සුරක්ෂිතභාවය තහවුරු වී තිබීම පුද්ගල සංවර්ධනයටත්, සමාජ සංවර්ධනයටත්, ජාතක සංවර්ධනයටත් ප්‍රබල ලෙස බලපාන සාධකයකි.
(ඉහත හැඳින්වීම අවබෝධයෙන් කියවීමෙන් ඔබට මෙම පාඩම පිලිබඳ අවබෝධයක් ලබාගත හැකිය )

<u>ගුණාත්මක යෙදවුම්</u> - පෙළපොත/ සමාජ සුරක්ෂිතතාව වෙනුවෙන් දායක වන ආයතන මගින් ඉටු කරන කාර්යයන් දැක්වෙන පින්තූර/ චිත්‍ර/ පුවත්පත් උපුටන

<u>ක්‍රියාකාරකම සඳහා සිසුන්ට උපදෙස්</u>

පියවර 01 - පෙළ පොතේ පිටු අංක 1 සිට 10 දක්වා අවබෝධයෙන් කියවන්න.

පියවර 02 - අභ්‍යාස පොත භාවිතා කරගෙන ප්‍රශ්න ලියා පිළිතුරු සපයන්න. (පාසල ආරම්භ වූ විට විෂය භාර ගුරුභවතා ට අභ්‍යාස පෙන්වන්න)

<u>ප්‍රශ්නාවලිය</u>

1. සමාජය යනු කුමක්ද?
2. සමාජ සුරක්ෂිතතාව යනු කුමක්ද?
3. සමාජ සුරක්ෂිතතාවය කෙරෙහි බලපාන ආයතන මොනවාද?
4. එම ආයතන තුළින් ඉටු කරන කාර්යයන් තුන බැගින් ලියන්න.
5. සමාජ ආයතන හා සංවිධාන 5ක් නම් කරන්න.
6. සමාජ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතන මොනවාද? නිදසුන් 6ක් දෙන්න.
7.

<u>පසු වැඩ</u>

ක්‍රියාකාරකම් 1.4 කරන්න

සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වූ පුද්ගලයෝ, එනම් ඒබ්‍රහම් ලින්කන්, තෝමස් අල්වා එඩිසන්, මර්සලින් ජයකොඩි පියතුමා වැනි අය ආදර්ශමත් වීමට හේතු පැහැදිලි කරන්න.

සැකසීම -
එම්.ඒ පත්මලතා මිය
නිවිතිගල අධ්‍යාපන කලාපය - ර/ පලාවෙල ශ්‍රී රත්නාකර මහා විද්‍යාලය - රත්නපුර